# තොරතුරු තාක්ෂණය විද්‍යාවේදී උපාධිය - අධ්‍යයන වර්ෂය 2022/2023 සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ හා වවුනියාව විශ්වවිද්‍යාලයේ පවත්වනු ලබන තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා අපේක්ෂකයින් තෝරාගැනීමේ පොදු අභියෝග්‍යතා පරීක්ෂණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධි අධ්‍යයන වැඩසටහන පෙරදැරිව සිසුන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පොදු අභියෝග්‍යතා පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කොට ඇත. ඒ අනුව මෙම පරීක්ෂණයට සහභාගී වී සමත්වන සිසුන්හට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ හෝ වව්නියාව විශ්වවිද්‍යාලයන් හට මේ සඳහා ප්‍රවේශය ලබාදීමට සලකා බලනු ලැබේ.

**මෙම අභියෝග්‍යතා පරීක්ෂණය පහත සඳහන් විභාග මධ්‍යස්ථානවලදී ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පමණක් පවත්වන බව දන්වා සිටිනු ලැබේ.**

| | |
|---|---|
| 01 | මිහින්තලේ |
| 02 | වවුනියාව |
| 03 | යාපනය |
| 04 | කුරුණෑගල |
| 05 | මහනුවර |
| 06 | කොළඹ |
| 07 | බදුල්ල |
| 08 | මාතර |
| 09 | මඩකලපුව |

### අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අවශ්‍ය සුදුසුකම්

අභියෝග්‍යතා පරීක්ෂණය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් **"ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා උපාධි අපේක්ෂක පාඨමාලා - අධ්‍යයන වර්ෂය 2022/2023"** නැමති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන අත්පොතේ 2.2.8.28 ඡේදයෙහි (පාඨමාලා කේතය 038) විස්තරකොට ඇත. **(99 සහ 100 පිටුව)**

### අයදුම්පත් යොමු කිරීම

01. පහත සඳහන් Google Form Link මගින් මෙම පොදු පරීක්ෂණය සඳහා 2023 සැප්තැම්බර් මස 22 දිනට හෝ ඊට පෙර අයදුම්පත් යොමුකරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

    https://forms.gle/BnfjXACdMQXGmDFs6

02. මේ සඳහා පහත සඳහන් ඕනෑම බැංකුවක ගිණුම් අංකයක් වෙත රු. 1500/- ක ගාස්තුවක් ගෙවන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

| | **බැංකුව** | | **අංකය** |
|---|---|---|---|
| i. | **මහජන බැංකුව** | - | **008-1-001-8-1725841 (අනුරාධපුර)** |
| ii. | **ලංකා බැංකුව** | - | **86017144 (මිහින්තලේ)** |

තවද මෙම මුදල් ගෙවූ ලදුපතෙහි Scan කරනලද පිටපතක් අයදුම්පත් සමග අමුණා එවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

03. පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පත් සමග අමුණා එවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

    i. **අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උ/පෙළ) විභාග සහතිකය**

    ii. **අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සා/පෙළ) විභාග සහතිකය**

    iii. **ජාතික හැඳුනුම්පත**

මෙම සහතිකවල පිටපත් අදාළ විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකරුවකු විසින් ඔවුන්ගේ නිල මුද්‍රාව යොදා එහි Scan කරන ලද පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතු වේ.

### සටහන

i. කිසියම් අයදුම්පතක් හෝ සහතිකයක නමෙහි යම් වෙනසක් ඇතිවුවහොත් ඒ සඳහා එම නමින් ප්‍රකාශවන්නේ එකම සහ එම පුද්ගලයාම බවට සනාථ කරන දිවුරුම් ප්‍රකාශයක් සැපයිය යුතුය.

ii. අත්‍යාවශ්‍ය ප්‍රවේශ සුදුසුකම් සපුරාගන්නා අයදුම්කරුවන්හට ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ.

iii. අයදුම්පත් ප්‍රතික්ෂේප වන අවස්ථා.

a) අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අවශ්‍ය අවම ප්‍රවේශ සුදුසුකම් සපුරා නොතිබේ නම්, එම අයදුම්කරුවන්ගේ අයදුම්පත්

b) නිසි පරිදි සහතික කරන ලද අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සා/පෙළ) හා අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උ/පෙළ), ජාතික හැඳුනුම්පත හෝ විදේශගමන් බලපත්‍රයේ පිටපත් සහ බැංකු තැන්පත් මුදල් ලදුපතෙහි පිටපත් අමුණා නොමැති අයදුම්පත්,

c) අසම්පූර්ණ අයදුම්පත්

d) අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්

ඉහත අවස්ථාවන් වලදී අයදුම්කරුවන් විසින් ගෙවනු ලැබූ කිසිදු මුදලක් කිසිම හේතුවක් මත ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

**අභියෝග්‍යතා පරීක්ෂණ පවත්වන දිනය :**

**2023 ඔක්තෝබර් මස 15 දා (ප.ව. 2.00 - ප.ව. 4.00)**

(විභාග පවත්වන දිනයෙහි කිසියම් වෙනසක් වුවහොත් ඒ පිළිබඳව අයදුම්කරුවන් දැනුවත් කරනු ලැබේ.)

**වැඩිදුර තොරතුරු සඳහා :**

http://www.rjt.ac.lk වෙත පිවිසෙන්න

උප ලේඛකාධිකාරී (විභාග හා අධ්‍යයන) දු.ක. අංක : 025-2266780,

ඊ මේල් : it_aptitude@rjt.ac.lk

**ලේඛකාධිකාරී,**
**රජරට විශ්වවිද්‍යාලය,**
**මිහින්තලේ.**